# ජනවාර්ගික කෝලාහල වලට ඉස්ලාමීය විසඳුම්

ජේ. වලීද් අහමද්
සහකාර කථිකාචාර්ය,
ඉස්ලාම් සහ අරාබි අංශය,
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

එක් ජනවර්ගයක් තවත් ජනවර්ගයක් කෙරෙහි ඇති ඊර්ෂ්‍යාව සහ පීඩාවේ ප්‍රතිඵලයක් වශයෙන් ජනවාර්ගික ගැටුම් ඇති වේ. ජාතිවාදී අදහස් නිසා ඇති වන වාර්ගික කෝලාහලවල අඩුවක් ලොව කොතැනකවත් නැති බව කිව යුතු කරුණකි . මන්දයත් ලෝකයේ සෑම අස්සක් මුල්ලක් නෑරම මුස්ලිම්වරුන්ට එරෙහි ක්‍රියාකාරකම් සක්‍රීයව ක්‍රියාත්මක වෙමින් පවතියි . ජීවිත අහිමි කිරීම්, ඉඩම් කොල්ලය , හමුදා ආක්‍රමණ හා පීඩන යනුවෙන් විහිදී යයි . මෙම ජාතිවාදී මිලේච්ඡන් මුස්ලිම්වරුන් ත්‍රස්තවාදීන් ලෙසත්, ඉස්ලාම් රටවල් හොර රටවල් ලෙසත්, ඉස්ලාමය දුෂ්ට මතවාදයක් (Evil Ideology) ලෙසත් හඳුන්වති .

වඩාත් කනස්සලු දායක කරුණ නම් අපේම මාතෘභූමිය තුළ පවා මේ ජාතිවාදී විරෝධී ප්‍රචාරයන් ඇවිස්සීමට ගෞරව ඇඳුම් පොරවා ගත් සමහරුන් විසින් මග පෙන්වන ලදී. අද ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු ජීවත් වන්නේ එවැනි ජාතිවාදී සිතුවිලි උතුරා යන තත්ත්වයක් මධ්‍යයෙණි . ඔවුන්ගේ උකුසු ග්‍රහණය ක්‍රමක්‍රමයෙන් දැඩි වූවක් මිස මඳක්වත් ලිහිල් නොවිය. මුස්ලිම්වරුන්ගේ ඇඳුම් ඇඳීමේ අයිතිය, ප්‍රචාර අයිතිය හා ජීවත්වීමේ අයිතිය වැනි මූලික අයිතිවාසිකම් පවා ඔවුන් විසින් උදුරා ගනිමින් පවතී.

ජනවාර්ගික කණ්ඩායම් පසුබිම් කරගෙන ක්‍රියාත්මක වන දේශපාලන බලවේගවල ක්‍රියාදාමයන් වල උත්සාහය ශ්‍රී ලංකාව තවත් මියන්මාරයක් බවට පත් කිරීමටය .

"ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන් මේ රටට ආවේණික වූවන් නොවන අතර ඔවුන් සෞදි අරාබියෙන් පැමිණි අය වේ . ඔවුන් නැවත සෞදි අරාබියට යා යුතුයි. යනුවෙන් ඔවුන්ගේ ජාතිවාදී වදන් ජාතිවාදය පැහැදිලිව හඟවයි. අන්තවාදය ජාත්‍යන්තර හා ජාතික වශයෙන් තුරන් කරනවා , අයිතීන් සුරකිනවා'යි බොරු පොරොන්දු පිටුපස මුස්ලිම් ජනතාවගේ ජීවිත හා දේපළ විනාශ කරමින් රාජසන්තක කරමින් සිටිති .

විරෝධතා පසුබිම: ඕනෑම ක්‍රියාකාරකමක් සඳහා පසුබිමක් දක්නට ලැබේ . ඉස්ලාමීය විරෝධතා සඳහා පසුබිම නිර්මාණය වූයේ අද ඊයේ නොවේ. ඉස්ලාමයට එරෙහි විරෝධතා එහි ආරම්භයේ සිටම පැවතුණි.

බද්ර් යුද්ධයේ සිට අඛණ්ඩ පැවැත්ම ක්‍රි.ව 11-13 සියවස් වල කුරුස යුද්ධ මෙහි උච්චතම අවස්ථාව ලෙස පුරෝකථනය කෙරේ. මෙයින් අසාර්ථක වූ කිතුනු උන්මත්තකයෝ ඉස්ලාමය සහමුලින්ම විනාශ කිරීමට බලා සිටියහ. මේ සඳහා ඔවුන් තමන්ට ලැබුණු අවස්ථා කිහිපයෙන් ද ප්‍රයෝජන ගත්හ. පසුව පළමු ලෝක යුද්ධයේදී තුර්කිය පරාජයට පත් වූ අතර කිලාෆත් පාලනය ද බොහෝ දුරට බිඳ වැටුණි. බහුතර මුස්ලිම් රටවල් යටත් විජිතවාදයට යටත් විය. කෙසේ වෙතත්, සැප්තැම්බර් 11 ද්විත්ව කුළුණු ප්‍රහාරයෙන් පසුව, මෙම ජාතිකවාදී සිතුවිලි ගැඹුරින් මුල් බැස පුළුල් ලෙස පැතිර ගියේය. මේවා දේශපාලන වශයෙන් වැසී ගියත් එය මුස්ලිම් ජාතිකයන්ගේ ආභාෂය ලැබූ වාර්ගික උන්මාදයක් බව කිසිවකුටත් ප්‍රතික්ෂේප කළ නොහැක.
මෙවැනි අභියෝගයන් ජාතිවාදය හැඟීම් වලට සමාරම්භය වේ.

බොස්නියාවේ සිදු වූ ඝාතනය , චෙච්නියාවේ සිදු වූ ඝාතනය, අප්‍රිකානු කළු ජාතිකයන්ට එරෙහිව සිදු වූ ඝාතනය, තවද පොලිස් දියුණු මුස්ලිම්වරුන්ට එරෙහිව සිදු වූ ඝාතන රැල්ලක් , වියට්නාමය හමුදා ඝාතන , ගුජරාත් මුස්ලිම්වරුන්ට එරෙහිව වාර්ගික ජන කෝලාහල , මෑතකදී මුස්ලිම්වරුන්ව කම්පනයට පත් කළ මියන්මාර් බෞද්ධයින්ගේ ප්‍රචණ්ඩත්වය, යනාදිය සඳහන් කළ හැකිය.

**<u>***අද ලෝක මුස්ලිම් ජනතාව ආසන්න වශයෙන් කෝටි 160ක් පමණ වේ. . මෙතරම් මුස්ලිම්වරුන් භීතියට පත් කරන යුදෙව්වන් සංඛ්‍යාව 1,40,00,000 ක් පමණි. මෙතරම් විශාල මුස්ලිම් ජනතාවක් සිටියත් යුදෙව්වන්ගේ අමානුෂික ක්‍රියා පාලනය කිරීමට ඔවුන්ට නොහැක්කේ ඇයි? . මුස්ලිම් රටවල් 51ක් තිබුණත් අසාධාරණයට ලක්වන මුස්ලිම් ජනතාවට අයිතිවාසිකම් ලබා නොදෙන්නේ ඇයි? මෙයට හේතුව 'අසමගිය' හැර වෙන කිසිවක් නැත.***</u>**

දීර්ඝ කාලීන මෙවන් වාර්ගික ගැටුම්වලට විසඳුමක් ලෙස වීර සටන් පාඨ සහ ප්‍රකාශවලින් , ඝෝෂාකාරී ඇඬීම් වලින් කිසිදු ඵලක් නැත. වාර්ගික ගැටලු ගැඹුරුය , පුළුල්ය. එබැවින්. , ඒවාට සරිලන පරිදි, අපගේ විසඳුම් ද ස්ථිර , දූරදර්ශී , වැරදි සහ දුර්වලතා විශ්ලේෂණය කිරීමෙන් ඉස්ලාමීය සම්මතයන් සහ සීමාවන් මත පදනම් විය යුත්ත ය . ඒ සඳහා ඉස්ලාම් බොහෝ සුන්දර විසඳුම් අපට පෙන්වා දී ඇත.

විවිධත්වයෙන් එකමුතු වෙමු :

මුස්ලිම්වරුන්ට එරෙහිව ජාතිවාදී ක්‍රියාකාරකම් නිසි අයුරින් කිරීමට සතුරාට උපකාර වන එක් සාධකයක් වන්නේ මුස්ලිම් ප්‍රජාව තුළ ඇති අසමගිය සහ බෙදීම් ය. මේ සියලු බෙදීම්, භේද ඇතිවන්නේ ආගමේ නාමයෙන් හා දේශපාලනය හේතු නිසා බිහි වී ක්‍රියාත්මක වෙමින් පවතී.

නූතන සමාජය තමාට එරෙහි ක්‍රියාමාර්ග සඳහා බාහිර හේතු හැර අභ්‍යන්තර හේතු අවධානය යොමු කරන්නේ නැත. නිකරුනේ අපේ සතුරන් විවේචනය කිරීමෙන් ඵලක් නැත. අප තුළ ඇති ද අඩුපාඩු මගහරවා ගත යුතුය.

"වරක් නබි (සල්) තම සගයන් දෙස බලා, 'කුසගින්නෙන් සිටින සතුන් ආහාර බඳුන් දෙස ඇදී එනවාක් මෙන් අන්‍යාගමික ප්‍රජාවන් එක්වී ඔබලාට එරෙහිව කටයුතු කිරීමට පෙළඹෙයි ,
එවිට එක් සහාබාවරයෙක්, 'අල්ලාහ්ගේ දූතයාණෙනි! එම අවස්ථාවේදී අපි ප්‍රමාණයෙන් අඩු වූවන් ලෙස සිටින්නෙමු ද ?' ඔහු ඇසුවා. එයට දේව දූතයාණන් 'නැත, ඒ වන විට ඔබලා සංඛ්‍යාමය වශයෙන් වැඩි වූවන් වනු ඇත. නමුත් ඔබලා ගංවතුරේ ගහගෙන ගිය රොඩු මෙන් සිටිනු ඇත. තවද, අල්ලාහ් නුඹලාගේ සතුරන්ගේ සිත්වලින් නුඹලා කෙරෙහි වූ බිය දුරු කර, නුඹලාගේ සිත් තුළ 'වහ්න්' යන සිතිවිල්ල ඇති කරන්නේය ."යි ඔහු පැවසූහ. එවිට 'වහ්න් යනු කුමක්ද? අල්ලාහ්ගේ දූතයාණනි! සහකරුවෙකු විමසූ විට, , 'ලෝකයට ආදරය කර සහ මරණයට වෛර කිරීම ' යනුවෙන් .නබි (සල් ) තුමාණන් පිළිතුරු දුන්නෝය.
වාර්තාකරු : සව්බාන් ( රලි) තුමා.
මූලාශ්‍රය: අබූ දාවූද්- 4288

මෙම නබිතුමාගේ කියමනට අනුව අද මුස්ලිම්වරුන්ගේ තත්ත්වය ගංවතුරෙන් සෝදා හරින ලද රොඩු වැනිය. මිනිස් බලය , සන්නද්ධ බලය , ඛණිජ භූමිය වැනි නොයෙකුත් සම්පත් මුස්ලිම්වරුන් දුර්වල කරයි. අල් කුර්ආනය මෙය මෙසේ ප්‍රකාශ කරයි.

“අල්ලාහ්ට හා ඔහුගේ ධර්ම දූතයාණන් හට නුඹලා අවනත වනු. නුඹලා ගැටුම් ඇති කර නොගනු. එවිට නුඹලා අධෛර්යයට පත් වනු ඇත. නුඹලාගේ බලය පහව යනු ඇත. තවද නුඹලා ඉවසීමෙන් කටයුතු කරනු. නියත වශයෙන්ම අල්ලාහ් ඉවසිලිවන්තයින් සමඟය.” (8:46)

ඉහත කී නබි වදන් සහ දේව වැකියත්, බොහෝ මුස්ලිම්වරුන් සිටියද ඔවුන් දුර්වලකමට හේතුව ලෙස බෙදීම් සහ අසමගිය වේ යනුවෙන් සඳහන් කරන අතර එයින් ඇතිවන බලපෑම් පිළිබඳ අනතුරු ඇඟවීම් කරයි.

අද ලෝක මුස්ලිම් ජනතාව ආසන්න වශයෙන් කෝටි 160ක් පමණ වේ. . මෙතරම් මුස්ලිම්වරුන් භීතියට පත් කරන යුදෙව්වන් සංඛ්‍යාව 1,40,00,000 ක් පමණි. මෙතරම් විශාල මුස්ලිම් ජනතාවක් සිටියත් යුදෙව්වන්ගේ අමානුෂික ක්‍රියා පාලනය කිරීමට ඔවුන්ට නොහැක්කේ ඇයි? . මුස්ලිම් රටවල් 51ක් තිබුණත් අසාධාරණයට ලක්වන මුස්ලිම් ජනතාවට අයිතිවාසිකම් ලබා නොදෙන්නේ ඇයි? මෙයට හේතුව 'අසමගිය' හැර වෙන කිසිවක් නැත.

ලෝකයේ බොහෝ බලසම්පන්න රටවල් තමන් තුළ ඇති ගැටුම් නිසා විනාශ වී ඇති බව ඉතිහාසය සනාථ කරයි. ස්පාඤ්ඤයේ මුස්ලිම්වරුන්ගේ වසර 700 ක පාලනය සහ ඉන්දියානු සුල්තාන් රාජ්‍යයේ වැටීම යනාදිය මෙයට උදාහරණ ලෙස ගෙන හැර පෑ හැකිය . ආගමික කටයුතුවලදී ආරවුල් ඇතිවීම වැළැක්විය නොහැක. කෙසේ වෙතත්, විවිධත්වය තුළින් ඒකීකත්වය දැකීම විශාල ජයග්‍රහණයකි . මුස්ලිම්වරුන්ත තුළ ඇති සතුරු ක්‍රියා ඔවුන්ව දුර්වල කිරීමට මුස්ලිම්වරුන්ගේ එදිරිවාදීන්ට අනුබල දෙන්නේ ය.

සමාජ සංහිඳියාවට සමහර ක්‍රමවේදයන් :

01. නායකත්වයට අවනත වීම.

සමාජයක් ඒකරාශී වීමට නම් නියතවම නායකත්වයක් යටතේ ඒකරාශී විය යුතුයි. එය අල්-කුර්ආනය මේ අයුරින් පහදයි .

'විශ්වාස කළවුනි, නුඹලා අල්ලාහ්ට අවනත වනු. එමෙන්ම රසූල්වරයාට ද බලය ඇත්තවුනට ද අවනත වනු. නමුත් යම් කරුණක නුඹලා එකිනෙකා මත ගැටුම් ඇති කරගත්තේ නම්. නුඹලා අල්ලාහ් හා පරමාන්ත දිනය විශ්වාස කරන්නන්ව සිටියෙහු නම් එවිට එය අල්ලාහ් වෙත ද රසූල්වරයා වෙත ද යොමු කරනු. එය වඩා ශ්‍රේෂ්ටය. එමෙන්ම (එහි) අවසානය ද වඩා අලංකාරය. නුඹ නොබැලුවෙහි ද" (4:59)

02. ගැටුම් වලින් මිදෙමු.

"අල්ලාහ්ට හා ඔහුගේ ධර්ම දූතයාණන් හට නුඹලා අවනත වනු. නුඹලා ගැටුම් ඇති කර නොගනු. එවිට නුඹලා අධෛර්යයට පත් වනු ඇත. නුඹලාගේ බලය පහව යනු ඇත. තවද නුඹලා ඉවසීමෙන් කටයුතු කරනු. නියත වශයෙන්ම අල්ලාහ් ඉවසිලිවන්තයින් සමඟය ". (8:46)

03. සහෝදරත්වය සමෘද්ධිමත් වේවා.

එක්සත් වීම යනු එකිනෙකා අතර සහෝදරත්ව හැඟීමෙන් සහ එකිනෙකාට උදව් කරමින් සුහදව කටයුතු කළ යුතුයි..

“නියත වශයෙන්ම දේව විශ්වාසවන්තයෝ සහෝදරයෝය. එහෙයින් නුඹලාගේ සහෝදරයින් අතර (සම්බන්ධතා) විධිමත් කරනු. තවද අල්ලාහ්ට බිය බැතිමත් වනු. නුඹලා කරුණාව ලැබිය හැකිවනු පිණිස.". (49:10)

04. විවේචනය අවශ්‍යයි අවලාද නැඟීම අනවශ්‍යය ;

සමාජයේ වැරැදි, ගැටුම් , අවුල් හටගත් දී ඒවා විවේචන හෝ වෙනත් හොඳ පැහැදිළි කිරීම් මගින් හෝ නිවැරදි කළ යුතුයි. ඔවුන් නොකළ දේ කළ බවටත් , ඔවුන්ගේ වැරදි විවේචනය කරමින් ප්‍රචාරය කිරීම තව තවත් බෙදීම් ඇති කරමින් විවිධත්වයට මග පාදයි.

"තවද දෙවියන් විශ්වාස කරන්නන් හා විශ්වාස කරන්නියන්ට ඔවුන් උපයා නොගත් දෑ වෙනුවෙන් හිංසා පීඩා කරන්නන් වනාහි ඔවුන් සැබැවින්ම මහා අපවාදයක් හා පැහැදිලි පාපයක් උසුලා ගත්තෝය." (33:58)

කැළඹිලි කාලවලදී ඉවසීම අවශ්‍ය වේ:

ඉස්ලාමය කිසිවිටක අසාධාරණකම් විඳදරාගැනීමට හෝ පීඩාවන්ට යටත් වන ලෙස පවසන්නේ නැත. ආවේග පූර්ණ නොවන ලෙසට එය වළක්වන්නේය . ජීවිත හා දේපළ ආරක්ෂා කිරීම සඳහා සටන් කිරීම ආගමික යුතුකමක් ලෙස ඉස්ලාම් මග පාදයි. ජිහාද් පිළිබඳ පැහැදිලි නිර්වචන ඉස්ලාම් ලබා දී ඇත. ඉස්ලාමය සහ මුස්ලිම් අනුගාමිකයින්වපවිවේචනය කරන්නන්ට එරෙහිව සටන් අරගල කරන මෙන් ඉස්ලාම් නොකියයි . ඔවුන් මතවාදීව මුහුණ දෙන බවට ඉස්ලාම් පවසයි.

ජාහිලියා කලයෙහි නබි (සල් ) තුමාණන්ට එරෙහිව එල්ල වූ කවීන්ගේ ප්‍රහාරයට ඔවුන්ට කවිවලින් ප්‍රතිප්‍රහාර එල්ල විය. අල් කුර්ආනය සහ නබි (සල් ) තුමාණන් ව හූනියම් කරු ; එය හූනියම් කරුවෙකු විසින් ලියන ලද පොතකි; මෙය දේව වැකි නොවන්නේ ය ; මනුෂ්‍යය වචනයන් යන්නෙන් විවේචන සහ අසත්‍ය මත මතු වූ විට "අප පහළ කළ දැහි නුඹලා සැකයෙහි පසුවූයෙහු නම් එවැනි පරිච්ඡේදයක් ගෙන එනු. තවද අල්ලාහ් හැර නුඹලාගේ සාක්ෂිකරුවන් (හවුල්කරුවන්) කැඳවනු. නුඹලා සත්‍යවාදීහු නම්."

පන්තිවාදය වෙනත් පන්ති වාදයකින් , ජනවාර්ගික ගැටුම් තවත් ජන වර්ගික ගැටුම කින් , ෆැසිස්ට්වාදය තවත් ෆැසිස්ට්වාදයකින් එරෙහි වීමට හෝ තුරන් කිරීමට නොහැක . එසේ කටයුතු කිරීම ෆැසිස්ට්වාදී මූලධර්මයන් වේ . "අවශ්‍ය තීරණ ගැනීමට ඕනෑම ක්‍රමවේදයක් යොදා ගත හැක " (ENDS JUSTIFY MEANS) යන්න ෆැසිස්ට්වාදී මූලධර්මය වේ.

"තවද බියෙන් හෝ සාගින්නෙන් හෝ වස්තුව ජීවිත හා බවභෝග අඩුකරමින් හෝ යම් දෙයකින් අපි නුඹලාව පිරික්සුමට ලක් කරන්නෙමු. නුඹ ඉවසිලිවන්තයිනට ශුභාරංචි දන්වනු. "

(2:155)

පෙර කී දේව වැකිය දුෂ්කරතා හමුවේ ඉවසීමෙන් ඇති වැදගත්කම පැහැදිලි කරයි . විශ්වාසවන්තයෙකු ගේ ( මුඃමින්වරයකුගේ ) තත්ත්වය අන් අයව පුදුමයට පත් කරවයි . ඔහු ප්‍රීතිමත් කාලවලදී සහ දුෂ්කර කාලවලදීත් සතුටින්ම සිටියි. ඔහු සතුටු වන විට ඔහුගේ මන්ත්‍රය වන්නේ "අල්හම්දු ලිල්ලාහි අලා කුල්ලි හාලින්" යන්නයි.

ප්‍රචණ්ඩත්වය හමුවේ දේව හැඟීම සහ ඉවසීම අධ්‍යාත්මික ජීවිතයට දිරිගැන්වීමක් සහ සුන්දර මනෝවිද්‍යාත්මක විසඳුමක් සපයයි.

" නුඹලාගේ වස්තුවෙහි ද නුඹලාගේ ආත්මාවන්හි ද සැබැවින් ම නුඹලා පරීක්ෂා කරනු ලබන්නෙහුය. තව ද නුඹලාට පෙර සිටි වේද ග්‍රන්ථ පිරිනමනු ලැබූවන්ගෙන් ද ආදේශ කළ අයගෙන් ද බොහෝ වද වේදනාවන් ගැන නුඹලා සවන් දෙන්නෙහු ම ය. තව ද නුඹලා ඉවසා බිය බැතිමත් වූයේ නම් එවිට සැබැවින් ම එය ස්ථාවර කරුණු අතුරින් (එකක්) වෙයි." (3:186)

ඉවසීමෙන් කටයුතු නොකර දේව හැඟීමෙනුත් කටයුතු නොකර ප්‍රචණ්ඩත්වය අතට ගත් විට එයින් සිදු වන්නේ ප්‍රචණ්ඩත්වය වැඩි වීම මිස ප්‍රචණ්ඩත්වයට විසඳුමක් නොවේ . එබැවින් සැබෑ මුස්ලිම්වරයෙකු විරෝධතාවලට බිය නොවන අතර අධෛර්යයට පත් නොවන අතර හැඟීම්බර වී ගැටලු අතිශයෝක්තියට පත් නොකරයි.

අන් අය සමග අලංකාරවත් අයුරින් ආශ්‍රය කිරීම :

වාර්ගික ගැටුම් සඳහා ඉස්ලාම් පෙන්වන එක් විසඳුමක් වන්නේ සහෝදරත්වය සහ යහපත් හැසිරීම වේ . මෙවැනි සහෝදරත්වය මුස්ලිම්වරුන්ට පමණක් සීමා නොවූ විට එය වාර්ගික ගැටුම්වලට හා ප්‍රතිවිරෝධතාවලට විසඳුමක් බවට පත්වේ. වෙනත්

ආගම්වල අය සමඟ වඩා හොඳ අයුරින් ආශ්‍රය කිරීම ඔවුන්ගෙන් අපට ඇතිවෙන ගැටළු අවම කරයි.

අන්‍ය ආගමිකයන් සමඟ හොඳ ඇයරින් ආශ්‍රය කිරීමට ඉස්ලාම් මග පෙන්වයි . මෙය නබි වදන් සනාථ කරයි .

නබි (සල්) තුමාණන් ඔහු ළඟ සේවය කළ යුදෙව් කොළුවෙකු අසනීප වූ විට, ඔහු හමුවීමට ගොස්, ඉස්ලාමය පිළිගන්නා ලෙස ඉල්ලා ළමයාගෙන් එම සිටියේය, ' පුතේ! ඔබ කාසිම්ගේ පියාට කීකරු වනු !' යැයි යුදෙව් පිරිමි ළමයාගේ පියාගේ වදන් නබි (සල්) කෙරෙහි තිබූ අන්‍යාගමිකයන්ගේ හොඳ සිතුවිලි සහ නබිතුමාගේ යහපත් හැසිරීම පෙන්නුම් කරයි. තවද යුදෙව් මරණයකට (ජනාසාවකට) නබිතුමාණන් සිටගත් ඒ සිද්ධිය එතුමණො අන්‍ය ආගමිකයන් කෙරෙහි තිබූ අභිමානය සහ මනුෂ්‍යත්වයයි පෙන්නුම් කරයි . එහෙත්, මෙයට වෙනස් අද මුස්ලිම්වරුන්ගේ ස්ථාවරය ජාතිවාදී කෝලාහල කැළඹවන ලෙසට පත් වී ඇත.

“අල්ලාහ් හැර ඔවුහු අයැදින දෑට නුඹලා බැණ නොවදිනු. " (6:108)

ඉහත කී අල් කුර්ආන් පදය ඔවුන් අල්ලාහ් ව හැර වෙනත් දෙවිවරුන් නැමදුම් කරන්නන් ලෙස සිටියත් ඒවාට නුඹලා බැණ නොවදිනු. ඔවුන් සමඟ හොඳාකාරව කටයුතු කරන ලෙසට මග පාදයි. ඔවුන් සමඟ හොඳාකාරව කටයුතු කිරීමත් සමඟ ඔවුන්ට විශ්වාසවන්තයන් ලෙසත් සිටිය යුතුයි. සෑම අවස්ථාවකදීම මනුෂ්‍යත්වය බැබළවිය යුතුය.

සබඳතා ශක්තිමත් කර ගැනීමට...

- වෙනත් ආගමිකයන් සමඟ පොදු වැඩවල නිරත වීම.
- සුබ පැතුම් හුවමාරු කර ගැනීම.
- ගැටළුමය අවස්ථාවේදී අපක්ෂපාතීව පහසුවෙන් විසඳා ගැනීම.
- ඔවුන් සමඟ සතුට බෙදා ගන්නවාති සමගම දුක්ඛ අවස්ථාවේදීත් සහය වීම.

- දුෂ්කරතා සහ අවශ්‍යතා හමුවේ පෙරමුණේ සිට  උපකාර කිරීම.

- ඔවුන්ගේ ආගමික  හා සංස්කෘතික ගෞරවය කිරීම.